රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 20/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1989 මාර්තු මස 13 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

විශේෂ නිවාඩු.

<u>ආයතන සංග්‍රහය - XII පරිච්ඡේදය.</u>

01. පහත දැක්වෙන පරිදි 12:1 උප වගන්තිය සංශෝධනය කරන්න.

සේවයේ හදිසි අවශ්‍යතාවන්ට යටත්ව, මුස්ලිම් භක්තික රජයේ නිලධාරියෙකුට සිය ආගමික වතාවත්වල යෙදීම සඳහා සිකුරාදා දිනවල ප. ව. 12.15 සිට පැය 2 කට වැඩි නොවන කාලයක විශේෂ නිවාඩුවක් දිය හැකිය.

02. පහත දැක්වෙන පරිදි 12:12 උප වගන්තිය සංශෝධනය කරන්න.

'ඉද්දා' පිහිටවීම සඳහා නිවාඩු - අදාළ වර්ෂයේ සහ ඊමාගේ මුළු සේවා කාලය තුළම පාවිච්චියට නොගෙන ඉතිරිව ඇති විවේක (සමුච්චිත හා ඉකුත් නිවාඩු) නිවාඩු හිලව් කරමින්, රජයේ සේවයේ නියුතු මුස්ලිම් විවාහක කාන්තාවකට 'ඉද්දා' පිහිටවීම සඳහා මාස 4 යුත් දින 10 ක් නොඉක්මවන පරිදි නිවාඩු ලබා දිය හැකිය. මෙම දින ගණන ඉක්මවන නිවාඩු කාලය 'අඩ වැටුප්' නිවාඩු විය යුතුය.

(සිරිල් ගමගේ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

මා/21